## 362 යහනක විලසේ

යහනක විලසේ සැතැපී සැපසේ
අප ගලවන සේ සිරි කුරුසේ
පණ පුදලමිනේ අප සැම පෙමිනේ
පණ ගන්වමිනේ රුකලන සේ

යනවද ජේසු /// කුරුසියටා

දෙනුවන ඇරිලා කඳුලින් පිරිලා
සියොලඟ ඉරිලා දුක් බරවී
සිරි පා නගලා දුර හෙළ බලලා
කුරුසිය කරු ලා මුව පරවී

යනවද ජේසු /// කුරුසියටා

අත් විහිදාලා හදට බදාලා
සැවොම මුදාලා දෙව් දරුසේ
මොක් සැපදීලා සැම රස ලීලා
අප වෙත පාලා ගෙන කුරුසේ

යනවද ජේසු /// කුරුසියටා